INTERNATIONAL TRUTH AND JUSTICE PROJECT

W ITJPSL.COM
E ITJPSL@GMAIL.COM

EXECUTIVE DIRECTOR:
YASMIN SOOKA

**මාධ්‍ය නිවේදනය: ශ්‍රී ලංකාවේ වධකයෝ ආණ්ඩු මාරුවේදීත් බේරෙති**

2019 සැප්තැම්බර් 18

**ජිනීවා:** වධ හිංසාවලට සම්බන්ධ බවට චෝදනා ලබන බව තමන්ද දන්නා පොලිස් නිලධාරීන්ට වර්තමාන රජයද ඇතුළුව ශ්‍රී ලංකාවේ දිගටම පැවති ආණ්ඩු විසින් පිට පිටම උසස්වීම් ලබා දී තිබේ. ශ්‍රී ලංකා පොලිසියේ ත්‍රස්තවාදී විමර්ශන දෙපාර්තමේන්තුවේ (TID) අණදෙන තනතුරු හොබවන්නන් ද ඇතුළුව වධකයන් ලෙසින් චෝදනා ලබන 58 දෙනකු ශ්‍රී ලංකාවේ සත්‍යය හා යුක්තිය සඳහා වන ජාත්‍යන්තර ව්‍යාපෘතිය (ITJP) විසින් කරන ලද නව අධ්‍යයනයකින් හඳුනාගනු ලැබ සිටී. ඔවුන් නම් කරන ලද්දේ සම්මුඛ සාකච්ඡා ලබා දුන් වධබන්ධනයට පාත්‍ර වූ 73 දෙනකු විසිනි. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ දශකයකට වඩා පැරණි වාර්තා වලින් නම් කර තිබෙන පොලිස් නිලධාරීන්ද ඒ අතර වෙයි. ඉන් අයකු එක්සත් ජාතීන්ගේ සාමසාධක නිලධාරියකු ලෙස පවා රාජකාරි කර ඇත්තෙකි.

*“පොලිස් වධහිංසා පිළිබඳව පුන පුනා නැගෙන චෝදනා සම්බන්ධයෙන් දක්වන නොසැලකිල්ල කම්පා කරවන සුළු අතර, සංක්‍රාන්ති යුක්තිය පසෙක තිබියේවා, ශ්‍රී ලංකාව විසින් ආරක්ෂක අංශ ප්‍රතිසංස්කරණය සඳහා ප්‍රකාශිත පොරොන්දු විහිලුවක් බවට පත් කරයි,” යනුවෙන් ITJP විධායක අධ්‍යක්ෂිකා යස්මින් සූකා පැවසුවාය. වධහිංසාවලට සම්බන්ධ බවට චෝදනා ලබන TID නිලධාරීන් 2007 දී එජා විශේෂඥයකු විසින්ද, දශක ගණනාවක් තිස්සේ ශ්‍රී ලාංකික රාජ්‍ය නොවන සංවිධාන සහ මානව හිමිකම් නීතිඥයන් විසින් ද, දැන් වධහිංසාවෙන් වින්දිතයන් ආරක්ෂා කරගැනීමේ පනත යටතේ හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ ට එරෙහිව පවරා ඇති නඩුවට ආධාර පිණිස ITJP විසින් කැලිෆෝනියාවේ අධිකරණයට භාර දී ඇති ලියවිලි වලින්ද නම් කොට තිබේ. එහෙත්, කවදාවත් කිසිදු පියවරක් ගෙන නොමැත. චූදිත වධකයෝ සෑම ආණ්ඩු මාරුවකදීම ගැලවීම ලබති.*

ත්‍රස්ත විමර්ශන ඒකකය විසින් පසුගිය දශකය පුරා රඳවාගෙන සිටි ගැහැනුන්ට සහ මිනිසුන්ට සංවිධිතව පමුණුවන ලද කුරිරු වධබන්ධන සහ ලිංගික ප්‍රචණ්ඩතා අලුත්ම ITJP වාර්තාවෙන් විස්තර කෙරේ. එහිදී කොළඹ TID කාර්යාලය සහ බූස්ස රැඳවුම් කඳවුර කෙරේ වැඩි අවධානයක් යොමු වේ. එම වාර්තාව සමග නිකුත් කර ඇති වින්දිතයන් විසින් නම් කරන ලද පොලිස් නිලධාරීන් 24 දෙනකුගේ විස්තර ඇතුලත් ලිපිගොනු එක්සත් ජනපදයේ

හවුස්ෆෙල්ඩ් නීතිඥ සමාගම විසින් ගෝඨාභය රාජපක්ෂට විරුද්ධව එක්සත් ජනපදයේ පවරා ඇති නඩුකරයේ කොටසක් වෙයි[1].

*"වධහිංසාව කොයි තරම් දුරට ත්‍රස්ත විමර්ශන දෙපාර්තමේන්තුවේ ආවේනික ලක්ෂණයක් වී ඇතිද කියතොත්, එම ඒකකයේ වැඩ කරන කිසිවකුටත් වගකීමෙන් ගැලවී යාම අසීරු කරුණක් වෙයි," යනුවෙන් යස්මින් සූකා පැවසුවාය. "වූදිත අපරාධකරුවන්ට නඩු පවරන තුරු, ජාත්‍යන්තර පුහුණු වැඩ සටහන්, එක්සත් ජාතීන්ගේ සාමසාධනය සහ වෙනත් ආකාරයේ ජාත්‍යන්තර ආධාර TID සාමාජිකයන්ට සලසා දීම තහනම් කළ යුතුය. ආරක්ෂක අංශයේ මේ ඒකකයේ කුණුවීම පුහුණු වැඩ සටහන් මගින් පමණක් විසඳ ගත නොහැකිය."*

දම්වැලින් එකට ගැටගසා TID පරිශ්‍ර කරා බස්වලින් ගෙනයාම හෝ සුදු වෑන් වලින් පැහැරගෙන යාම, නිරුවත් කිරීම, ගුද මාර්ගය පරීක්ෂා කිරීම, වධක මෙවලම් වලින් සමන්විත ලේ පැල්ලම් සහිත බිත්තියෙන් යුත් කාමර වලදී ප්‍රශ්න කරනු ලැබීම, නොකළ දේවල් කළ බවට බලහත්කාරයෙන් පාපොච්චාරණ ලබාගැනීම සහ වධහිංසා පිළිබඳව පරීක්ෂකයන්ට නොකියන ලෙස අනතුරු ඇඟවීම සම්බන්ධයෙන් රැඳවියන් විස්තර කර තිබේ. පහරදීම්, පයින් ගැසීම්, මුෂ්ටි ප්‍රහාර, කස ප්‍රහාර, වේදනාකාරී ඉරියව්වෙන් එල්ලා තැබීම, පැට්‍රෝල් සහ මිරිස් කුඩු දැමූ ප්ලාස්ටික් මලු වලින් හුස්ම හිර කිරීම, වතුර යොදගෙන වද දීම, සිගරට් වලින් පිච්චීම, ගිනියම් යකඩින් හංවඩු ගැසීම සහ ලිංගික දූෂණය ඇතුළු වෙනත් ආකාර ලිංගික හිංසනයට ගොදුරු කරනු ලැබීම ගැන වාර්තාවේ එන සාමාන්‍ය වැසියන් විසි එක් දෙනකු ඇතුළු හැත්තෑ තුන් දෙනා විස්තර කරති. ඇතැමුන් විවිධ ආරක්ෂක ඒකක මගින් වසර ගණනක් තිස්සේ රැඳවුම් ස්ථාන ගණනාවක සිර කරගෙන සිටි අයය. සමහරුන් සිරභාරයෙන් හෝ හිටපු සටන්කාමීන් සඳහා වන "පුනරුත්ථාපන" වැඩසටහනෙන් නිදහස් කරන ලද පසු TID විසින් පැහැරගෙන යන ලද්දවුන්ය. සම්මුඛ පරීක්ෂා කෙරුණු විසි දෙනකු වත් වධහිංසාවෙන් පසු සියදිවි නසාගන්නට තැත් කර තිබේ.

*" 'අහිංසක' ගනයේ ලා සැලකෙන සාමාන්‍ය වැසියන් භුක්ති විඳින මානව අයිතිවාසිකම් ම චූදිත ත්‍රස්තවාදීන් ද භුක්ති විඳිය යුතු නැතැයි ඇතැම් අංශ තුල පැතිර පවත්නා අදහසක් තිබේ. මෙය, අසමමිතික යුද්ධයක සටන් වැදී සිටි හෙයින් අහිංසක සාමාන්‍ය වැසියන් ඉලක්ක කරගැනීමේදී යුද නීති අත්හිටුවීම යුක්ති සහගත කිරීමට ශ්‍රී ලංකාව මීට ඉහත 2009 දී කළ ප්‍රකාශ ප්‍රතිරාව නැංවීමකි. මෙය නීති විරෝධී පමණක් නොව සදචාරාත්මක වශයෙන් පිළිකුල් සහගත ද වෙයි. මේ වාර්තාවේ විස්තර කෙරෙන සංවිධානාත්මක කෙලෙසීම්වලට එරෙහිව සකල ශ්‍රී ලාංකිකයන් මහත්සේ තම හඬ නැගිය යුතුය. කෙසේ වෙතත්, මේ දශකයක නිහැඬියාව බිහිරි කරවන සුළුය," යි සූකා මහත්මිය පැවසුවාය.*

වහාම වැඩ තහනම් කොට විභාග කළ යුතු අපරාධ චූදිතයන් අතර මේ අයද වෙති:

**නන්දන මුණසිංහ:** උතුරු මැද සහ වයඹ පළාත් සඳහා වර්තමාන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වන මොහු වධහිංසාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිත විසින් වධහිංසාවට සම්බන්ධ චූදිතයකු ලෙසින් 2008 දී නම් කර තිබේ; *(ප්‍රදර්ශක භාණ්ඩය B, නිර්නාමිකත්ව ප්‍රකාශනය, ITJP වෙබ් අඩවිය, පිටු අංක 89-93)*

**ආඩම්බරගේ රුවන් ප්‍රසන්න ජයක් ද අල්විස්:** හිටපු TID අධ්‍යක්ෂ සහ දැන් කොළඹ අපරාධ විමර්ශන ඒකකයේ. මේ වාර්තාවේ වින්දිතයන් 10 දෙනකු විසින් හඳුනාගෙන ඇති අතර 1998 දී රාජ්‍ය නොවන සංවිධාන වාර්තාවකින් නම් කර තිබේ. *(ප්‍රදර්ශක භාණ්ඩය A, නිර්නාමිකත්ව ප්‍රකාශනය, ITJP වෙබ් අඩවිය, පිටු අංක 43-56)*

---

[1] http://www.itjpsl.com/assets/press/ECF-No.-0066-3-Exhibit-B-to-Sooka-Decl.pdf මෙය http://www.itjpsl.com/reports/gotabaya-rajapaksa-complaint හි B ප්‍රදර්ශක භාණ්ඩය වෙයි

**ලාල් ගමගේ:** කලින් බූස්ස රැඳවුම් කඳවුරේ ස්ථානාධිපති, වර්තමානයේ යාපනයේ සේවයේ යොදවා සිටින මොහු වද දීමට සෘජුවම සම්බන්ධ අයකු ලෙස මේ වාර්තාවේ එන වින්දිතයන් 9 දෙනකු විසින් නම් කර තිබේ.

INTERNATIONAL
TRUTH
AND JUSTICE
PROJECT